# රදවාගැනීමේ බදු (ර.ගැ.බ.) සහ අත්තිකාරම් ආදායම් බදු වාර්ෂික ප්‍රකාශය සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්මාලාව තක්සේරු වර්ෂය 2021/2022

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (දේශීය ආදායම් පනත) විධිවිධාන ප්‍රකාරව, 2021/2022 තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනතේ 86 වන වගන්තිය යටතේ සපයා ඇති පරිදි සෑම **රදවාගැනීමේ අනුයෝජිතයෙකු** විසින්ම **2022 අප්‍රේල් 30** වන දින හෝ එදිනට පෙර උපලේඛන සමග වාර්ෂික ප්‍රකාශයක් (**ආකෘති අංක. Asmt WHT_001_E**) භාරදීම අවශ්‍ය වේ.

ර.ගැ.බ./අ.ආ.බ. සම්බන්ධව වාර්ෂික ප්‍රකාශය සහ උපලේඛන භාරදීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමුකිරීම අවශ්‍ය වේ.

## 1. රදවාගැනීමේ බදු (ර.ගැ.බ.) සහ අත්තිකාරම් ආදායම් බදු (අ.ආ.බ.) ප්‍රකාශය සහ උපලේඛන භාරදීම

### i. ගොනු කිරීමේ ක්‍රමය

#### අ) ඊ - සේවාව හරහා ගොනු කිරීම

2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධනය කළ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 113(1අ) වගන්තිය ප්‍රකාරව, 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික ප්‍රකාශ ඊ-සේවාව හරහා ගොනු කිරීම මගින් (බදු වාර්තා විද්‍යුත් ආකාරයට ගොනු කිරීම) භාරදීම,

(අ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම් (සියළුම වාසික සීමිත වගකීම් සමාගම්);

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම් (සියළුම නිර්වාසික සීමිත වගකීම් සමාගම්); සහ

(ඇ) රාජ්‍ය සංස්ථා,

යනාදියට අනිවාර්යය වේ.

එහෙයින් මෙම තක්සේරු වර්ෂය සහ ඉන්පසු එළඹෙන තක්සේරු වර්ෂයන් සඳහා එවැනි අස්තිත්වයන් තම රදවාගැනීමේ බදු වාර්ෂික ප්‍රකාශය, මුද්‍රිත විශේෂ ආකෘති භාවිතා කරමින් අතින් සම්පූර්ණ කර එවීමට හිමිකම් නොලබති.

ඉහත සඳහන් කර නොමැති වෙනත් රදවාගැනීමේ බදු අනුයෝජිතයින් සඳහා ද තම වාර්ෂික ප්‍රකාශය විද්‍යුත් මාර්ගයෙන් භාරදීමේ හිමිකම පවතී. තවද අනෙකුත් රදවාගැනීමේ බදු අනුයෝජිතයින්, දේශීය ආදායම් පනතේ 113(4) වගන්තියේ සපයා ඇති පරිදි පෙර තක්සේරු වර්ෂය සඳහා තම වාර්ෂික ප්‍රකාශ විද්‍යුත් ආකාරයට ගොනුකර ඇති තැනැත්තන් වේ නම්, තම වාර්ෂික ප්‍රකාශ විද්‍යුත් මාර්ගයෙන් ගොනු කිරීම අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් ද්වාරයේ ඊ- සේවාව හරහා ගොනු කිරීම සඳහා පහසුකම් සලසා ඇත. වැඩිදුර තොරතුරු සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් ද්වාරයේ (www.ird.gov.lk) ඇති කඩිනම් උපදෙස් මාලාව පරිශීලනය කරන්න.

**ආ) අතින් ගොනු කිරීම**

මුද්‍රිත විශේෂිත ආකෘති මගින් තම වාර්ෂික ප්‍රකාශය භාරදීමට අපේක්ෂා කරන රඳවාගැනීමේ අනුයෝජිතයින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මධ්‍ය ලේඛන කළමනාකරණ ඒකකයට හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකට අතින් රැගෙනවිත් හෝ තැපෑල මගින් භාරදිය හැකිය.

**පහත කරුණු සැලකිල්ලට ගෙන රඳවාගැනීමේ බදු සහ අත්තිකාරම් ආදායම් බදු සඳහා වන උපලේඛන භාරදෙන්න.**

අ) ර.ගැ.බ./අ.ආ.බ. බැදියාවට යටත් වන සමුච්චිත සේවානියුක්තිකයින් සංඛ්‍යාව **20 ට වැඩි** නම්;

i. ඔබගේ උපලේඛන **ඊ-සේවාව හරහා/පද්ධතිය උඩුගත කිරීමෙන්** භාරදීම අනිවාර්යය වේ. (කරුණාකර උපදෙස්මාලාව පරිශීලනය කරන්න.)

ii. ඊ-සේවා පහසුකම ඔබට නොමැති නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ ස්ථාපනය කර ඇති "**නැණසැළෙහි**" හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයන්හි ඇති ඊ-සේවා පහසුකම් භාවිතා කරමින් ඔබගේ උපලේඛන (මෘදු පිටපත්) භාරදිය හැකිය.

iii. උඩුගත කිරීමේ පරිපාටිය ඔබට නුපුරුදු නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙහි පිහිටා ඇති "**නැණසැළට" හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලයකට** රැගෙනවිත් ඒවායේ සේවයේ නියුතු දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහාය ලබාගන්න.

ආ) ර.ගැ.බ./අ.ආ.බ. බැදියාව සඳහා වන සමුච්චිත සේවානියුක්තිකයින් සංඛ්‍යාව **20 ට සමාන හෝ ඊට අඩු වන්නේ නම්** අදාළ උපලේඛනවල දෘඩ පිටපත් හෝ මෘදු පිටපත් භාරදීමේ විකල්පය ඔබ වෙත ඇත.

වාර්ෂික ප්‍රකාශයේ දෘඩ පිටපත් **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මධ්‍යම ලේඛන කළමනාකරණ ඒකකයට** භාරදිය යුතුය. කෙසේ වුවද වාර්ෂික ප්‍රකාශය ප්‍රධාන කාර්යාලය වෙත භාරදීමේ යම් අපහසුතාවයක් පවතී නම් ළඟම පිහිටා ඇති දේශීය ආදායම් දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලයට භාරදිය හැකිය. ඔබ වාර්ෂික ප්‍රකාශය ඊ-සේවාව හරහා භාරදී ඇත්නම්, එහි දෘඩ පිටපත් භාරදීම අවශ්‍ය නොවේ.

## 2. රඳවාගැනීමේ බදු සහ අත්තිකාරම් ආදායම් බදු ප්‍රකාශය සම්පූර්ණ කිරීම

### 2.1 I කොටස - රඳවාගැනීමේ බදු (ර.ගැ.බ.) අඩු කිරීම්වල සාරාංශය

මෙම කොටස යටතේ රඳවාගැනීමේ බදු අඩුකිරීම්වල විස්තර ඔබ විසින් ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ.

මෙම කොටස යටතේ **පළමු කොටු අට තුළ (කොටු 1-8) නිර්වාසිකයින්ගෙන්** අඩු කළ රඳවාගැනීමේ බදු පිළිබඳ විස්තර ප්‍රකාශ කළ යුතුය. **ත්‍යාග හෝ ලොතරැයි/ඔට්ටු/සූදු දිනුම්වලින්** රඳවාගැනීමේ බදු අඩු කිරීම් **9 වන කොටුවේ** ද වෙන්දේසියක දී මැණික් විකිණීමෙන් රඳවාගැනීමේ බදු අඩු කිරීම් ප්‍රකාශ කිරීමට **10 වන කොටුව මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට** විශේෂිත වේ.

### 2.2 II කොටස - අත්තිකාරම් ආදායම් බදු (අ.ආ.බ.) අඩු කිරීම්වල සාරාංශය.

මෙම කොටස යටතේ අත්තිකාරම් ආදායම් බදු අඩු කිරීම්වල විස්තර ඔබ විසින් ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ.

රඳවාගනු ලැබීමට යටත් වන්නා විසින් ලබාදී ඇති ප්‍රකාශය මත පදනම්ව අඩුකළ අත්තිකාරම් ආදායම් බදු පිළිබඳ විස්තර මෙහි ප්‍රකාශ කළ යුතුය.

**2.3 III කොටස - මාසික ගෙවීම් සාරාංශය**

මෙම කොටසේ රඳවාගැනීමේ බදු සහ අත්තිකාරම් ආදායම් බදු මත ඔබගේ මාසික බදු බැදියාව සමග ගෙවීම් ක්ෂේත්‍ර 43 සහ 44 යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඔබ විසින් සිදුකළ ගෙවීම/ගෙවීම් පිළිබඳ විස්තර වෙන වෙනම ප්‍රකාශ කිරීම අවශ්‍යය වේ.

වාර්තා සහ උපලේඛන භාරදීමට පෙර පහත කොන්දේසි සපුරා ඇති බව සහතික කරගන්න.

i. වාර්තාවේ කොටුව IA(d) + IIA(d) = වාර්තාවේ කොටුව IIIA (f)
ii. වාර්තාවේ කොටුව III (a) + කොටුව III (c) = උපලේඛනය 1 (ර.ගැ.බ අඩු කළ ප්‍රමාණවල කොටුව)
iii වාර්තාවේ කොටුව III (b) + කොටුව III (d) + කොටුව III (e) = උපලේඛනය 2A (ර.ගැ.බ අඩු කළ ප්‍රමාණවල කොටුව) + උපලේඛනය 2B (ර.ගැ.බ අඩු කළ ප්‍රමාණවල කොටුව)

**2.4 IV කොටස - ප්‍රකාශනය**

**(අ) කොටස**

ප්‍රකාශය හෝ ප්‍රකාශයේ කොටසක් බදු ගෙවන්නාගේ පූර්ණකාලීන සේවානියුක්තිකයෙකු නොවන අනුමත ගණකාධිකාරිවරයෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් සකස් කර ඇති අවස්ථාවකදී A කොටස සම්පූර්ණ කර එවැනි තැනැත්තෙකු විසින් නිකුත් කළ සහතිකය/ සහතික අමුණන්න.

**(ආ) කොටස - රඳවාගැනීමේ බදු අනුයෝජිතයාගේ ප්‍රකාශනය**

දේශීය ආදායම් පනතේ 126(4) වගන්තිය ප්‍රකාරව බදු ගෙවන්නෙකු හෝ බදු ගෙවන්නාගේ බලයලත් අනුයෝජිතවරයෙකු ප්‍රකාශයේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණභාවය සහතික කර එහි අත්සන් කළ යුතුය. එහෙයින් වාර්ෂික ප්‍රකාශයේ IV වන කොටසේ (B) කොටස යටතේ ඔහුගේ/ඇයගේ නම සහ තනතුර සඳහන් කර කළමනාකරණ අධ්‍යක්ෂ/දෙපාර්තමේන්තු ප්‍රධානි/සභාපති හෝ සක්‍රීය හවුල්කරු/මූල්‍ය අධ්‍යක්ෂ/සභාපති/භාරකරු/ගණකාධිකාරී/පරිපාලන නිලධාරී/ප්‍රධාන නිලධාරී/ බලයලත් තැනැත්තා වාර්ෂික ප්‍රකාශයේ අත්සන් (දිනය ද සහිතව) කළ යුතුය.

**3. රඳවාගැනීමේ බදු උපලේඛන සම්පූර්ණ කිරීම**

**3.1 රඳවාගැනීමේ බදු උපලේඛනය 1 (වාසික තැනැත්තා සඳහා පොළිය හෝ වට්ටම් මත රඳවාගැනීමේ බදු)**

පොළී හෝ වට්ටම් ගෙවීම් මත ර.ගැ.බ./අ.ආ.බ. අඩු කළ තැනැත්තෙකු විසින් මෙම උපලේඛනය සම්පූර්ණ කළ යුතුය.

1. *අනුක්‍රමික අංකය.* – අනුක්‍රමික අංකය 1 න් ආරම්භ විය යුතු අතර සමාන අංකයක් කිසිදු අවස්ථාවක නැවත සඳහන් නොවිය යුතුය. ගොනුවේ එක් අනුවාදයකට වඩා සකස්කර ඇත්නම් [ධාරිතාව ප්‍රමාණවත් නොවීමෙන් (උදා: ගොනු ධාරිතාව 10MB ඉක්මවන විට)] අනුක්‍රමික අංකවල නිවැරදි පිළිවෙල අනුයාත අනුවාදවල තිබිය යුතුයි.

2. *ආයෝජන වර්ගය* – පහත සඳහන් ලැයිස්තුවෙන් ගැළපෙන ආයෝජන වර්ගය තෝරාගන්න.

   ව්‍යාපාර ණය
   තැන්පතු සහතිකය

වාණිජ පත්‍රිකා/පෙරොන්දු නෝට්ටු
ණයකර
ස්ථාවර තැන්පතු
විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්
අරමුදල්වල ආයෝජන
අනේවාසික විදේශ මුදල් ගිණුම
වෙනත්
ඉතුරුම්
භාණ්ඩාගාර බැඳුම්කර/සුරැකුම් පත්

3. *රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ නම:* – රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ නම ඉංග්‍රීසියෙන් සඳහන් කළයුතු අතර උපරිම අකුරු සංඛ්‍යාව 100 ට සීමා වේ.
4. *රඳවාගනු ලැබීමට යටත් වන්නාගේ ලිපිනය:* – රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ ලිපිනය ඉංග්‍රීසියෙන් සඳහන් කළ යුතුය. කිසිදු අවස්ථාවක “කොමා“ යොදා නොගත යුතු අතර ඒ වෙනුවට ඉඩක් තබන්න. උපරිම අකුරු සංඛ්‍යාව 100 ට සීමා වේ.
5. *රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය:* – රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ වලංගු බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය සඳහන් කරන්න. රඳවාගනු ලැබීමට යටත්වන්නා “බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය“ සපයා නොමැති අවස්ථාවක දී අදාළ කොටුව හිස්ව තැබිය යුතුය.
6. *ගිණුම් අංකය/සහතික අංකය:.* – ගිණුම් අංකය හෝ සහතික අංකය සඳහන් කළයුතු අතර එවැනි අංකයක් ඉලක්කම් 30 නොඉක්මවිය යුතුය.
7. *ආයෝජන වටිනාකම (රු.):* - මෙම තක්සේරු වර්ෂය සඳහා පොළිය ගෙවූ ආයෝජන වටිනාකම සඳහන් කරන්න. මෙම කොටුවේ දශමස්ථාන දෙකක් සහිතව ඉලක්කම් 15 ක් පමණක් ඇතුළත් විය යුතුය.
8. *ගෙවූ පොළී/වට්ටම් වටිනාකම (රු.):* – තක්සේරු වර්ෂයේ ගෙවූ පොළියේ වටිනාකම මෙහි ඇතුළත් කළ යුතුය. කාලපරිච්ඡේද ලෙස පොළිය ගෙවූයේ නම් සෑම කාලපරිච්ඡේදයක් සඳහාම ගෙවූ පොළිය වෙනම ප්‍රකාශ කළ යුතුය. මෙම කොටුවේ උපරිමය කොටු 15 ක් පමණක් විය යුතුය. (දශමස්ථාන 2 කද ඇතුළුව.)
9. *ර.ගැ.බ. අනුප්‍රමාණය (%):* – රඳවාගැනීමේ බදු අඩු කිරීමේදී අදාළ කරගත් අනුප්‍රමාණය මෙහි සඳහන් කළ යුතුය.
10. *ර.ගැ.බ. අඩු කළ ප්‍රමාණය (රු.):* – අඩු කළ රඳවාගැනීමේ බදුවල වටිනාකම මෙහි දැක්විය යුතුය. මෙම කොටුවේ උපරිමය ඉලක්කම් 15 ක් (දශමස්ථාන 2 කද ඇතුළු) පමණක් ඇතුළත් විය යුතුය.
11. *ගෙවීම් අඩු කළ මාසය:* - Dropdown ලැයිස්තුවෙන් ගෙවීම් කළ මාසය තෝරාගන්න.
12. *ර.ගැ.බ. සහතික අංකය:* – රඳවාගනු ලැබීමට යටත්වන්නාහට ඔබ විසින් නිකුත් කළ රඳවාගැනීමේ සහතිකය/සහතිකවල අංකය/ අංක සඳහන් කරන්න. මෙම කොටුවේ උපරිමය ඉලක්කම් 30 ක් පමණක් ඇතුළත් විය යුතුය.
    රඳවාගනු ලැබීමට යටත්වන්නා හට ඔබ විසින් ර.ගැ.බ. සහතිකයක් නිකුත් කර නොමැති නම් මෙම කොටුව හිස්ව තැබිය යුතුය.
13. *එකතුව:* - 10 වන තීරුවේ සමුච්චිත ප්‍රමාණය මෙහි සඳහන් කළ යුතුය.

### 3.2 රඳවාගැනීමේ බදු උපලේඛන 2A සහ 2B

වාසික සහ නිර්වාසිකයින් මත පොළිය, වට්ටම් හැර 84 සහ 85 වන වගන්තීන් යටතේ අඩු කළ රඳවාගැනීමේ බදු 2A සහ 2B උපලේඛනවල පිළිවෙලින් ප්‍රකාශ කළ යුතුය.

වාසිකයින් හට සිදුකළ ගෙවීම් සඳහා 2A අදාළ වේ.

නිර්වාසිකයින් හට සිදුකළ ගෙවීම් සඳහා 2B අදාළ වේ

1. *අනුක්‍රමික අංකය.* – අනුක්‍රමික අංකය 1 න් ආරම්භ විය යුතු අතර සමාන අංකයක් කිසිදු අවස්ථාවක නැවත සඳහන් නොවිය යුතුය. ගොනුවේ එක් අනුවාදයකට වඩා සකස්කර ඇත්නම් [ධාරිතාව ප්‍රමාණවත් නොවීමෙන් (උදා: ගොනු ධාරිතාව 10MB ඉක්මවන විට)] අනුක්‍රමික අංකවල නිවැරදි පිළිවෙල අනුයාත අනුවාදවල තිබිය යුතුයි.

2. *ගෙවීම් වර්ගය* – පහත ලැයිස්තුවෙන් අදාළ ගෙවීම් වර්ගය තෝරාගන්න.

ගාස්තු
කොමිස්
උපදේශන
ලාභාංශ
මැණික් වෙන්දේසිය
නිර්වාසිකයෙකුට සිදු කරන ගොඩබිම්,සාගර හෝ ගුවන් ප්‍රවාහනය හෝ විදුලි සංදේශ
සේවා ගෙවීම්
කළමනාකරණ සේවා ගාස්තු
ස්වභාවික සම්පත් ගෙවීම්
වෙනත්
රක්ෂණ වාරික මුදල්
කුලිය
රාජ්‍ය භාග
සේවා ගාස්තු
ඉගැන්වීම හෝ දේශන පැවැත්වීම
තාක්ෂණික ගාස්තු
ස්වයංක්‍රීය සේවා පදනම මත සපයනු ලබන ඕනෑම සේවයක් සම්බන්ධයෙන් වන ගෙවීම්,
වෙනත්
ලොතරැයි/ත්‍යාග/ඔට්ටු හෝ සූදුවලින් දිනුම්

3. රඳවාගනු ලැබීමට *යටත්වන්නාගේ නම:* - රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ නම ඉංග්‍රීසියෙන් සඳහන් කළ යුතු අතර උපරිම අකුරු සංඛ්‍යාව 100 ට සීමා වේ.

4. (අ)*රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ ලිපිනය:* – රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ ලිපිනය ඉංග්‍රීසියෙන් සඳහන් කළ යුතුය. කිසිදු අවස්ථාවක "කොමා" යොදා නොගත යුතු අතර ඒ වෙනුවට ඉඩක් තබන්න. උපරිම අකුරු සංඛ්‍යාව 100 ට සීමා වේ.

   (ආ)*රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ රට* (2B උපලේඛනය සඳහා): රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ වාසික රට ඇතුළත් කරන්න.

5. *රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ බ.ගෙ.හ.අං./ජා.හැ.අං.*– රඳවාගනු ලැබීමට යටත්වන්නාගේ වලංගු බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය හෝ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න. බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය හෝ ජාතික හැඳුනුම්පත් අංකය රඳවාගනු ලැබීමට යටත්වන්නා විසින් සපයා නොමැති අවස්ථාවක මෙම කොටුව හිස්ව තබන්න.

6. *මාසයක් තුළ සිදු කළ ගෙවීම් සංඛ්‍යාව:* - මාසයක් තුළ තැනැත්තෙකුට ගෙවීම් කීපයක් සිදුකර ඇත්නම් එක් ර.ගැ.බ. සහතිකයක් පමණක් දිය යුතු අතර එකී පුද්ගලයාට සිදුකළ ගෙවීම් සංඛ්‍යාව සහතිකයේ සඳහන් කරන්න.

7. *ගෙවූ මුළු මුදල:*- රඳවාගනු ලැබීමට යටත්වන්නාට දුන් රඳවාගැනීමේ බදු සහතිකය/සහතික අනුව සිදුකළ ගෙවීම්වල මුළු වටිනාකම (බදු ද ඇතුළත්) මෙහි සඳහන් කළ යුතුය. උපරිමය ඉලක්කම් 15 ක් පමණක් (දශමස්ථාන 2 කද ඇතුළත්ව) විය යුතුය.

8. *ර.ගැ.බ. අනුප්‍රමාණය (%):*- රඳවාගැනීමේ බදු ගණනය සඳහා අදාළ කරගත් බදු අනුප්‍රමාණය මෙහි සඳහන් කළ යුතුය.

9. *අඩු කළ ර.ගැ.බ. ප්‍රමාණය (රු.):*- ගෙවීම්වලින් අඩුකළ රඳවාගැනීමේ බදුවල වටිනාකම මෙහි සඳහන් කළ යුතුය. මෙම කොටුවේ උපරිමය ඉලක්කම් 15 ක් (දශමස්ථාන 02 කද ඇතුළුව) විය යුතුය.

10. *ගෙවීම් අඩු කළ මාසය:*- Dropdown ලැයිස්තුවෙන් අදාළ වන ගෙවීම් මාසය තෝරාගන්න.

11. *ර.ගැ.බ. සහතික අංකය:*- රඳවාගනු ලැබීමට යටත්වන්නාට ඔබ විසින් නිකුත්කළ රඳවාගැනීමේ බදු සහතිකයේ අංකය මෙහි සඳහන් කළ යුතුය. මෙම කොටුවේ උපරිමය ඉලක්කම් 30 ක් පමණක් විය යුතුය. රඳවාගනු ලැබීමට යටත්වන්නාට ඔබ විසින් ර.ගැ.බ. සහතිකයක් නිකුත් නොකළේ නම් මෙම කොටුව හිස්ව තැබිය යුතුයි.

12. *එකතුව:*- 9 වන තීරුවේ සමුච්චිත ප්‍රමාණය මෙහි සඳහන් කළ යුතුය.

පහත සඳහන් දුෂ්කරතාවයන් තිබේ නම් අමතන්න;

- **පද්ධතිය අඩපණවීම:** 1944 අමතා දේශීය ආදායම් දෙපාර්තමේන්තු ඇමතුම් මැදිරිය හා සම්බන්ධ වී සහාය ලබාගත හැකි අතර එසේ නොමැති නම් හඬ පටිගත කිරීමක් තබා ටිකට් අංකයක් ගන්න.
- **උඩුගත කිරීමේ දෝෂ:** 0112134162 හෝ 011-2134133 මගින් මධ්‍යම දත්ත කළමනාකරණ ඒකකය අමතන්න.
- **උපලේඛන සත්‍යාපනය කිරීම හා සම්බන්ධ ගැටළු:** 0112134162 හෝ 011-2134133 මගින් මධ්‍යම දත්ත කළමනාකරණ ඒකකය අමතන්න.
- **ඊ-සම්පූර්ණ කිරීම පිළිබඳ ගැටළු:** 011-2134098/011-2135242/011-2134222 අමතන්න.